43

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 2110.03 – අන්තර්මධ්‍ය සූක්ෂම ආර්ථික විද්‍යාව**

කාලය පැය තුන (03) යි

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. i. සංඛ්‍යා සූචක උපයෝගීතාව සහ ක්‍රම සූචක උපයෝගීතාව අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. පාරිභෝගික හැසිරීමට අදාළ සම ආන්තික උපයෝගීතා කොන්දේසියෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

iii. උපේක්ෂා වක්‍ර විග්‍රහය ආශ්‍රයෙන් පාරිභෝගික සමතුලිත කොන්දේසිය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

02. i. ගිෆින් භාණ්ඩයක් යනු කුමක්ද? එය සාමාන්‍ය භාණ්ඩයකින් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 04)

ii. බාල භාණ්ඩයක මිළ පහළ යාමක ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක අතර වෙනස රූප සටහනක් ආධාරයෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 06)

iii. උපේක්ෂා වක්‍රවල ප්‍රායෝගික යෙදීමක් උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

03. i. කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය සහ දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය අතර වෙනස කුමක්ද?

(ලකුණු 04)

ii. පරිමාණානුකූල ඵල නීතිය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. ආයතනයක මුළු පිරිවැය ශ්‍රිතය පහත දැක්වේ.

$$TC = 2000 + 5Q + 10Q^2$$

පහත දැක්වෙන එක් එක් පිරිවැය සංකල්ප සඳහා ප්‍රකාශන ලබා ගන්න.

a. මුළු ස්ථාවර පිරිවැය

b. සාමාන්‍ය ස්ථාවර පිරිවැය

c. මුළු විචල්‍ය පිරිවැය

d. සාමාන්‍ය විචල්‍ය පිරිවැය

e. සාමාන්‍ය මුළු පිරිවැය

f. ආන්තික පිරිවැය

(ලකුණු 03)

iv. කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය ඉංග්‍රීසි 'U' අකුරක හැඩය ගන්නේ කුමක් නිසාද?

(ලකුණු 03)

04. i. ලාභ උපරිමයක් සඳහා අදාළ වන අවශ්‍යය සහ ප්‍රමාණවත් කොන්දේසි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. පූර්ණ තරඟකාරී ආයතනයක් මිළ ගණුවෙක් වන්නේ කුමක් නිසාද?

(ලකුණු 04)

iii. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිත මිළ සහ ප්‍රමාණය තීරණය වන ආකාරය කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

05. i. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ii. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක සමතුලිත මිළ සහ ප්‍රමාණය පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ සමඟ සසඳන්න.

(ලකුණු 10)

iii. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළකට අදාල අධි ධාරිතාවයේ කුමන හෝ වාසි තිබේද? ඔබේ පිළිතුරට හේතු සඳහන් කරන්න.

(ලකුණු 04)

06. i. ඒකාධිකාරයකු ලාභ උපරිම කිරීමේ දී මිළ ආන්තික පිරිවැයට වඩා ඉහළින් තිබෙන බව පෙන්වන්න.

(ලකුණු 08)

ii. අවම පිරිවැය ආයතනය මිළ නායකත්වය යටතේ මිළ හා ප්‍රමාණය තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

07. කෙටි සටහන් ලියන්න.

i. හෙළිකළ වරණ න්‍යාය

ii. කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතය

iii. ආදායමේ වන්දි විචලනය සහ ආදායමේ සමබල විචලනය

iv. වහන්තරා වක්‍රය

**(එක් කොටසකට ලකුණු 04 බැගිනි.)**